**පොලිස් ත්‍යාග අරමුදල - 2017**

**------------------------------------------------**

පොලිස් ත්‍යාග අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පොලිස් ආඥාපනතේ 73 (4) වගන්තිය (65 අධිකාරය) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පොලිස් ත්‍යාග අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අත්තිකාරම් ලබාදීමේදී දෙන ලද සම්පූර්ණ අත්තිකාරම් මුදලම වියදම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළදී ලබාදී තිබූ අත්තිකාරම් මුදලින් 2018 වර්ෂයේ දී රු.41,169,710 ක් මුදලින් පියවා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.819,738,597 ක් ලෙස ගණනය කර ගිණුම්ගතකර තිබුණද, විගණනය විසින් සිදුකරන ලද ගණනය කිරීම් අනුව එම ආදායම රු.818,254,231 ක් වීමෙන් මූල්‍ය ප්‍රකාශනවල පොලී ආදායම හා ලැබිය යුතු ආයෝජන ආදායම් රු.1,484,366 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී නිර්දේශ කර තිබූ විශේෂ ත්‍යාග 03 කට අදාල එකතුව රු.720,000 ක මුදලින් රු.410,000 ක් ගෙවා තිබුණි. ගෙවිය යුතු රු.310,000 ක වටිනාකම ආදායම් ප්‍රකාශනයේ විශේෂ ත්‍යාග වියදම් තුල හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු විශේෂ ත්‍යාග වටිනාකම තුල දෙවරක් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී විශේෂ ත්‍යාග දෙකකට අදාල ගෙවිය යුතුව පැවති රු.600,000 ක් වූ වටිනාකම වර්ෂය තුලදී ගෙවා තිබුණු අතර එය ගෙවිය යුතු වියදම් ගිණුමට හර කිරීම වෙනුවට ආදායම් ප්‍රකාශනයේ විශේෂ ත්‍යාග වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) විශේෂ ත්‍යාග 07 කට අදාල නිර්දේශිත රු.511,500 ක්වූ මුළු ත්‍යාග මුදලින් සමාලෝචිත වර්ෂය තුලදී ගෙවන ලද රු.300,750 ක් පමණක් විශේෂ ත්‍යාග වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ නිසා ආදායම් ප්‍රකාශනයේ විශේෂ ත්‍යාග වියදම හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු විශේෂ ත්‍යාග වටිනාකම රු.210,750 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාලව මහේස්ත්‍රාත් අධිකරණ 15 කින් එකතුව රු.2,788,453 ක දඩමුදලක් 2018 වර්ෂයේදී ලැබී තිබුණ ද ඒවා 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්ෂික දඩ මුදල් ආදායම සහ ලැබිය යුතු උසාවි දඩමුදල් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

## 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල උපලේඛන අංක 03 හි දැක්වෙන උසාවි 12 ක උසාවි දඩමුදල් ආදායම අධිකරණ වෙතින් ලද ශේෂ සනාථන සමග සැසඳීමේදී රු.4,401,626 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී දඩමුදල් ලැබීම්, මහේස්ත්‍රාත් අධිකරණ වාර්තා හා පොලිස් කොට්ඨාශ වාර්තා සමග සැසඳීමේදී රු. 1,182,666 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 08 කින් විගණනය වෙත සෘජුව ලබාදී තිබූ රථ වාහන දඩමුදල් ආදායම් වාර්තා සහ මුදල් පොත හා රථවාහන ආදායම් ලෙජර් ගිණුම සමඟ සැසඳීමේදී එකතුව රු.2,136,496 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පොලිස් අනුග්‍රාහක අරමුදලට අත්තිකාරම් ලෙස ලබා දී තිබූ රු.2,000,000 ක්, වර්ෂ 18 කට වැඩිකාලයක සිට නිරවුල් කිරීමට කටයුතු නොකර දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) විශේෂ වැටලීම් සඳහා අරමුදලින් ත්‍යාග ගෙවීමේදී නඩු අවසන් වීමට පෙර සියයට 50 ක මුදලක් ගෙවනු ලබයි. ඉතිරි ත්‍යාග මුදල් ගෙවීමට උසාවි නඩු කටයුතු අවසන් නොවීම මත ලිපිගොනු 251 කට අදාලව වර්ෂ 01 ත් වර්ෂ 10 ත් අතර කාලයකට අයත් එකතුව රු.57,719,711 ක් වූ ගෙවිය යුතු විශේෂ ත්‍යාග සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවතුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,663,672,229 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,272,679,612 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.390,992,617 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළ ස්ථාවර තැන්පතු පොලී ලැබීම් රු. 350,486,731 කින් වැඩි වීම ඉහත වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------------

### 4.1 කාර්යසාධනය

--------------------

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

----------------------------------------------

ත්‍යාග ලබා දීම මගින් ප්‍රධාන පොලිස් පරීක්ෂක හා ඊට පහළ පොලිස් නිලධාරින්ගේ රාජකාරින් කාර්යක්ෂම ආකාරයෙන් සිදුකර ගැනීම සඳහා පොලිස් නිලධාරින් ඒ සඳහා පෙළඹවීම හා පොලීසියට අවශ්‍ය තොරතුරු ලබා දෙන සිවිල් පුද්ගලයන් සඳහා ත්‍යාග ගෙවීම අරමුදල විසින් සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රධාන කාර්යය ලෙස ඉටු කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී සියළුම පොලිස් කොට්ඨාශ වෙත සාමාන්‍ය අග්‍රිමය ලෙස රු.514,806,255 ක් ද රථවාහන අග්‍රිමය ලෙස රු.196,778,225 ක් ද ලබා දී තිබුණ ද වර්ෂය අවසානයේ පිළිවෙලින් රු. 41,036,704 ක් හා රු.22,319,356 ක් වශයෙන් පොලිස් ත්‍යාග අරමුදල වෙත ආපසු එවා තිබුණි. කොට්ඨාශ නිලධාරීන්ගේ ත්‍යාග ගෙවීමේ අවශ්‍යතාවන් හදුනාගෙන මුදල් ලබාදීම හා ත්‍යාග ගෙවීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු නොවීම වාර්ෂික ත්‍යාග අග්‍රිම මුදල් ආපසු එවීමට හේතුවී තිබුණි. කොට්ඨාශ මට්ටමින් නිරීක්ෂණය වූ ප්‍රධාන කරුණු පහත දැක්වේ.

(i) සමාලෝචිත වර්ෂයේ වැඩිම ත්‍යාග අග්‍රිමය වූ රු. මිලියන 54.04 ක් ගම්පහ කොට්ඨාශය වෙත ලබාදී තිබුණි. රු. මිලියන 48.04 ක් වූ සාමාන්‍ය අග්‍රිමයෙන් රු. මිලියන 9.90 ක් ද රු. මිලියන 6 ක් වූ රථවාහන අග්‍රිමයෙන් රු.මිලියන 2 ක් ද ත්‍යාග ගෙවීම සඳහා උපයෝජනය කර නොගැනීම මත වර්ෂය අවසානයේ ආපසු එවා තිබුණි.

(ii) දෙවනුව වැඩිම ත්‍යාග අග්‍රිමය වූ රු. මිලියන 49.43 ක් කොළඹ කොට්ඨාශය වෙත ලබාදී තිබුණි. රු. මිලියන 21.65 ක් වූ සාමාන්‍ය අග්‍රිමයෙන් රු. මිලියන 5.63 ක් ද රු. මිලියන 27.78 ක් වූ රථවාහන අග්‍රිමයෙන් රු. මිලියන 5.37 ක් ද ත්‍යාග ගෙවීම සඳහා උපයෝජනයකර නොගැනීම මත වර්ෂය අවසානයේ ආපසු එවා තිබුණි.

(iii) අනුරාධපුර කොට්ඨාශය වෙත රු. මිලියන 32.03 ක් ලබා දී තිබුණි. එයින් රු.මිලියන 23.41 ක් වූ සාමාන්‍ය අග්‍රිමයෙන් රු. මිලියන 5.31 ක් ත්‍යාග ගෙවීම සඳහා උපයෝජනය කර නොගැනීම මත වර්ෂය අවසානයේ ආපසු එවා තිබුණි.

(ආ) රථ වාහන දඩ මුදල් ආදායමින් ත්‍යාග ගෙවීමේදී 2011 සැප්තැම්බර් 12 දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2304/2011 අනුව පොලිස් ස්ථානවල රථවාහන අංශයේ නිලධාරීන්ට එම නිලධාරීන්ගේ තනතුර අනුව රු.1,200 සිට රු.3,000 දක්වා උපරිම මාසික ත්‍යාග මුදල් ගෙවීම සිදුවේ. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) මාසික ත්‍යාග මුදල් කාලානුරූපීව හා ආදායමට සාපේක්ෂව සංශෝධනය නොවීම නිසා රථවාහන දඩ මුදල් ආදායමින් සියයට 72 කට වැඩි ප්‍රමාණයක් පසුගිය වසර තුන පුරාම ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2017 | 2016 | 2015 |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| රථවාහන දඩමුදල් ලැබීම | 668,025,613 | 643,700,294 | 535,368,163 |
| රථවාහන ත්‍යාග ගෙවීම් | 174,458,869 | 152,474,691 | 148,163,969 |
| ඉතිරිය | 493,566,744 | 491,225,603 | 387,204,194 |
| ඉතිරියේ ප්‍රතිශතය | 73.88 | 76.31 | 72.32 |

(ii) සමාලෝචිත වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවෙන් ලැබුණු රු.645,580,931 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් ලැබුණු රු.22,444,682 ක් රථ වාහන දඩ මුදල් ආදායම ලෙස ගිණුම්ගතකර තිබුණද එම ආයතන මගින් ලබා දෙන ත්‍යාග මුදල්වල නිවැරදිතාවය තහවුරුකර ගැනීම සඳහා පොලිස් ස්ථාන හා කොට්ඨාශ මට්ටමින් රථ වාහන දඩ මුදල් ආදායම් වාර්තා පිළියෙල කර පරීක්ෂා කිරීමේ අභ්‍යන්තර ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) රාජ්‍ය බැංකු 03 ක ආයෝජනය කර ඇති ස්ථාවර තැන්පතු හා ඒමත උපයා ඇති පොලී ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනට ශේෂය | | |
|---|---|---|---|
| | 2017 | 2016 | 2015 |
| | රු.මි. | රු.මි. | රු.මි. |
| ස්ථාවර තැන්පත් | 8,123 | 6,750 | 5,533 |
| ස්ථාවර තැන්පත් මත පොලී | 819 | 469 | 325 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය තුලදී අරමුදල උපයා තිබූ මුළු ආදායම රු. මිලියන 4,408 ක් විය. එම කාල පරිච්ඡේදය තුල අරමුදලේ ආයෝජන රු.මිලියන 2,590 කින් වර්ධනය වී තිබුණි. මේ අනුව මුළු ආදායමින් සියයට 58 ක් ආයෝජන සඳහා වැයකර තිබුණි. දිවයින පුරා පිහිටි පොලිස් ස්ථාන මගින් සිදුකරන වැටලීම් සඳහා උසාවි මගින් නියමකරන දඩමුදලින් සියයට 50 ක් හා රථවාහන දඩමුදලින් සියයට 40 ක් ලෙස ආදායම් ලබන අරමුදල පිහිටුවීමේ අරමුණවන පොලිස් නිලධාරීන් දිරිගැන්වීම සඳහා ත්‍යාග මුදල් පිරිනැමීම හා ඔවුන්ගේ සුභසාධනය සිදුකිරීම සඳහා මුළු ආදායමින් රු. මිලියන 1,471 ක් හෙවත් සියයට 33 ක් පමණක් වැය කර තිබුණි.

(ii) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පිළිවෙලින් රු. මිලියන 433.47 ක්, රු.මිලියන 386.09 ක්, රු.මිලියන 325.67 ක්, රු.මිලියන 469.25 ක් හා රු. මිලියන 819.73 ක් බැගින් එකතුව රු. මිලියන 2,434.21 ක් ස්ථාවර තැන්පතු මත පොලී ආදායම් ලෙස උපයාගෙන තිබුණද මෙම ආදායම් අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව තීරණයක් ගෙන නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------------

### 5.1 අයවැය ලේඛනමය පාලනය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය තුල රථවාහන දඩ මුදල් ආදායම ඇස්තමේන්තුකර නොතිබුණ ද තථ්‍ය රථ වාහන දඩ මුදල් ආදායම රු. 668,025,614 ක් විය. එමෙන්ම විවිධ ආදායම් ලෙස රු. 550,000,000 ක් ඇස්තමේන්තුකර තිබුණ ද අරමුදල වෙත විවිධ ආදායම් ලැබී නොතිබුණි.

(ආ) අයවැයෙහි ප්‍රතිපාදන සලසා නොතිබුණු ජල පිරිපහදු ව්‍යාපෘති සඳහා සැපයුම් අංශය වෙත සහ පොලිස් දෙපාර්තමේන්තුවේ ක්‍රීඩකයින් සඳහා ත්‍යාග ගෙවීම සඳහා පොලිස් ක්‍රීඩා අරමුදලට පිළිවෙලින් රු.35,479,452 ක් හා රු.32,595,000 ක් වැය කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර පොලිස්පතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගෙවීම් පාලනය | අධිකරණ කටයුතු අවසන්වී වසර 03 සිට වසර 06 දක්වා ප්‍රමාද වී විශේෂ ත්‍යාග ගෙවූ අවස්ථා 06 ක් නියදි පරීක්ෂාවේදී අනාවරණය වීම. |
| (ආ) ආදායම් රැස්කිරීම | තැපැල් දෙපාර්තමේන්තුවෙන් මාසිකව ලැබිය යුතු රු. මිලියන 30 සිට රු. මිලියන 60 දක්වා වූ රථවාහන දඩමුදල් ආදායම් අරමුදල වෙත ලැබීමේදී මාස 02 සිට මාස 05 දක්වා ප්‍රමාදයන් සිදුවීම. |
| (ඇ) ත්‍යාග චෙක්පත් භාරදීම | ත්‍යාග හිමි නිලධාරීන් වෙත චෙක්පත් භාරදීම කාර්යක්ෂමව හා නිවැරදිව සිදු නොවීම හේතුවෙන් 2017 වර්ෂය තුලදී නිලධාරීන් 201 කට හිමි විශේෂ ත්‍යාග එකතුව රු.1,435,500 ක් වූ චෙක්පත් රජයේ ආදායමට ගැනීම. |
| (ඇ) ගිණුම්කරණය | සමාලෝචිත වර්ෂය තුලදී යොදාගත් ජ'නල් සටහන් 151 ක් සඳහා ජ'නල් වවුචර භාවිතාකර නොතිබීම. |
| (ඉ) අයවැය ලේඛනමය පාලනය | ප්‍රගතිය පදනම් කරගෙන ආයතනය විසින් අයවැය ලේඛන නැවත නැවත සංශෝධනය කිරීම. |